## 11 පාඩම

**එකතු කිරීම - 04 පැවරුම**

වගන්ති ලියා ගැටලු විසඳමු.

උදාහරණ : අඹ ගොඩක අමු අඹ ගෙඩි 256 ක් ද ඉදුණු අඹ ගෙඩි 318 ක් ද ඇත. එහි ඇති මුළු අඹ ගෙඩි ගණන කීය ද?

| | | |
|---|---|---|
| අඹ ගොඩක ඇති අමු අඹ ගණන | = | 256 |
| ඉදුණු අඹ ගණන | = | + 318 |
| අඹ ගොඩේ ඇති මුළු අඹ ගණන | = | 574 |

1. 3 ශ්‍රේණියේ සිසුහු 143 ක් ද 4 ශ්‍රේණියේ සිසුහු 182 ක් ද සිටිති. ශ්‍රේණි දෙකේ ම සිටින මුළු සිසුන් ගණන කීය ද?
2. මලිති ළඟ මුද්දර 523 ක් ද දිනුනි ළඟ මුද්දර 218 ක් ද ඇත. දෙදෙනා ම ළඟ ඇති මුද්දර ගණන කීයද?
3. එක ගසකින් ජම්බු ගෙඩි 350 ක් ද තවත් ගසකින් ජම්බු ගෙඩි 270 ක්ද කඩන ලදී. ගස් දෙකෙන් ම කැඩූ ජම්බු ගෙඩි ගණන කීය ද?
4. මා ළඟ වීදුරු බෝල 129 ක් තිබුණි. අයියා මට වීදුරු බෝල 125 ක් දුන්නේ ය. දැන් මා ළඟ ඇති විදුරු බෝල ගණන කීය ද?